(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක 1(6).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2015 නොවැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා**

---

## 2015 දෙසැම්බර් මස 07 වැනි සඳුදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

19/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වර්ෂ 2011 - 2014 අතර කාලය තුළ සමුපකාර සංවර්ධන අරමුදලේ හා සමුපකාර අතිරික්ත අරමුදලේ රුපියල් මිලියන 897.06ක්, 1972 සමුපකාර සමිති පනතේ දැක්වෙන ප්‍රතිපාදනවලට පටහැනිව අවභාවිතා කිරීම සහ සාවද්‍ය පරිහරණයට ඉඩහැරීම යන චෝදනා යටතේ හිටපු අමාත්‍යවරයාට හා හිටපු සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාට එරෙහිව පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය වෙත පැමිණිලි කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් වන පැමිණිල්ලේ විමර්ශනවල ප්‍රගතිය කවරේද;

(ii) මෙම මුදල් අවභාවිතය හා සාවද්‍ය පරිහරණය පිළිබඳව පොදු දේපළ පනත යටතේ විමර්ශනයක් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මුදල් අවභාවිතය හා සාවද්‍ය පරිහරණය පිළිබඳව ආයතනික මට්ටමින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) අහිමි වූ මුදල් යළි අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iii) විෂයභාර අමාත්‍යවරයාගේ අභිමතය පරිදි පොදුවේ රාජ්‍ය අරමුදල් අවභාවිතය වැළැක්වීම සඳහා ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

80/'15

ගරු චන්දිම ගමගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) පසුගිය දශකයක පමණ කාලය තුළ පුරාවස්තූන් හා නිදන් වස්තූන් බරපතල ලෙස විනාශවීම් හා සොරුන්ගේ ග්‍රහණයට ලක්වීම් පිළිබඳව විවිධ මාධ්‍ය මගින් වාර්තාකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) මාධ්‍ය මගින් වාර්තා වූ සිද්ධීන් හා ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නීතිමය පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, නීතිමය පියවර ගෙන ඇති සිද්ධීන් හා පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම නීතිමය ක්‍රියාමාර්ග තුළින් වැරදිකරුවන් කර ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) මෙවැනි සිද්ධීන් යළි ඇති නොවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 08 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

164/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේ නියැලී සිටි, ශ්‍රී ලංකා යුද හමුදා සෙබළු විශාල සංඛ්‍යාවක් වසර 12ක් යුද හමුදාවේ සේවය කර හමුදා සේවයෙන් ඉවත්ව සිටින බවත්;

(ii) ඔවුන් මේ වනවිට ඉතා අසරණ තත්ත්වයෙන් පසුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යුද හමුදාවේ වසර 12ක් සේවය කර හමුදා සේවයෙන් ඉවත්වී සිටින සෙබළුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට සහනයක් සැලසීමට කටයුතු කරන්නේද;

(iii) රට වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ එම පිරිසට අර්ධ විශ්‍රාම වැටුපක් ලබාදීම සුදුසු බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම අර්ධ විශ්‍රාම වැටුප ලබා දීමට කටයුතු සලසන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

227/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුනාමි විපතින් හානියට පත් තම නිවස සඳහා සහාධිපත්‍ය නිවාසවලින් නිවසක් ලද, ඩබ්. ප්‍රදීප් මහතාගේ දරුවා, 2013 වසරේ මාතර සුජාතා විද්‍යාලයේ පළමු පන්තියට ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වී තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළ හේතු කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනය ප්‍රතික්ෂේප වී තිබේද;

(iv) එසේ නම්, ඊට අදාළ හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ප්‍රතික්ෂේප කිරීම් වලින් පසුව, අදාළ දැරිය පාසලට ඇතුළත් කරගෙන, ඒ බව දැනුම් දෙන ලෙස දන්වා අමාත්‍යාංශ ලේකම් හා ජාතික පාසල් අධ්‍යක්ෂ විසින් විදුහල්පතිවරයා වෙත ලිඛිතව දැනුම් දීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ලිඛිත දැනුම් දීම සම්බන්ධයෙන් විදුහල්පතිවරයාගේ ප්‍රතිචාර කවරේද;

(iii) එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර දැරිය පාසලට ඇතුළත් කරගෙන නොමැති බව දන්නේද;

(iv) එම දැරිය පාසලට ඇතුළත්කර නොගැනීමට හේතු කවරේද?

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ප්‍රතික්ෂේප කිරීමට අදාළව විධිමත් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එම දැරියට සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 09 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

177/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුනාමි ව්‍යසනය නිසා නිවාස අහිමිවූවන්ගේ ප්‍රශ්නය සම්බන්ධයෙන්, අම්පාර දිසාපති/දිස්ත්‍රික් ලේකම් දැනුවත් කරන ලද ජනාධිපති ලේකම් කාර්යාලයේ 2010.09.30 දිනැති අංක SD/8/2 ලිපිය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2010.11.02 දිනැති අංක MNBD/06/AD/CO/16 ලිපිය සහ ආපදා කළමණාකරණ අමාත්‍යාංශයේ 2010.09.23 දිනැති අංක MDM/AS/DM/46 ලිපිය යන ලිපි පිළිබඳව ගනු ලැබූ පියවර කවරේද;

(ii) ඒවායේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සුනාමි ව්‍යසනය නිසා අම්පාර දිස්ත්‍රික්කයේ, සායින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස අහිමි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) නිවාස අහිමිවූවන් අතරින් මේ වනවිට ස්ථිර නිවාස ලබාදී ඇති පුද්ගලයින්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

239/'15

ගරු විමලවීර දිසානායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුපියල් ලක්ෂ දෙකකට හෝ ඊට අඩු මුදලකට බැංකුවලට උකසට තබා ඇති, රන් භාණ්ඩ බේරා ගැනීමේදී ජනතාවට සහනයක් ලෙස ඒ සඳහා අය කෙරෙන අධික පොළිය හා දඩ මුදල් කපා හැරීමට රජය ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන තිබේ නම්, ඒ සඳහා අදාළ බැංකුවලට යවන ලද චක්‍රලේඛ පිටපත් සභාගත කරන්නේද;

(ii) එක් එක් බැංකු මගින්, එසේ පොළී හා දඩ මුදල් කපා හැර ඇති, ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා රජය මගින් අදාළ බැංකුවලට මූල්‍ය ප්‍රතිපාදන ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම මුදල් ප්‍රමාණය, එක් එක් බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

178/'15

ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එම්. එම්. ඒ. නිෆ්රාන් මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් පදිංචිව සිටි දික්වැල්ල, යෝනකපුර, වෙදගෙදර, අංක 264/1 දරන නිවස, කඳු ආශ්‍රිත ප්‍රදේශයක පිහිටා තිබූ බවත්;

(ii) 2012.09.22 දින ඇද හැලුනු වර්ෂාව නිසා කැඩී බිඳී ගිය එම නිවසෙහි ඉතිරිව තිබූ මුළුතැන්ගෙයද, 2015.09.02 දින අලුයම 1.45ට පමණ යාබද පස් කඳු නාය යාම නිසා සම්පූර්ණයෙන්ම විනාශයට පත් වී ඇති බවත්;

(iii) මේ සම්බන්ධයෙන් ප්‍රදේශයේ වගකිව යුතු නිලධාරීන් දැනුවත් කළද මේ දක්වා කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කුඩා දරුවන් හා බිරිඳ සමග පවුලක් ලෙස ජීවත්වීමට තිබූ එම නිවස සම්පූර්ණයෙන් කැඩී බිඳී යෑමෙන් සහ ස්ථිර ආදායම් මාර්ගයක් නොමැතිකමින් අසරණභාවයට පත්ව සිටින නිෆ්රාන් මහතාට එම නිවස ඉදිකර දීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

240/'15

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අවදානම් මත බර තැබීමේ ක්‍රමය අනුව, ශ්‍රී ලංකාවේ විදේශ සංචිතවල ප්‍රමාණවත්භාවය පිළිබඳව සැහීමට පත්වන්නේද;

(ii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි, අවදානම් මත බර තැබීමේ නව ක්‍රමය යෙදීමේදී, X; STD; OPL සහ M2 යන විචල්‍යයන්හි දත්ත අනුව, වර්ෂ 2000 සිට 2014 දක්වා, පාවෙන විනිමය අනුපාතික ක්‍රමය යටතේ, විදේශ සංචිතවල ප්‍රමාණාත්මකභාවය, එක් එක් වර්ෂය අනුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේ ගෙවුන මාස 9 තුළ ශ්‍රී ලංකාවේ විදේශ සංචිතවල ප්‍රමාණාත්මකභාවය කෙසේවීද;

(ii) එම තත්ත්වය කෙරෙහි බලපෑ ප්‍රධාන හේතූන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2015 දෙසැම්බර් මස 11 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

204/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පළාතේ, මහනුවර, දෙල්තොට, මුස්ලිම් මහ විද්‍යාලයට (නවෝද්‍යා පාසල) නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ අවශ්‍යතාවය සැළකිල්ලට ගෙන ජනාධිපති ලේකම්ගේ නියෝගය පරිදි මධ්‍යම පළාත් අධ්‍යාපන හා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ 2012.10.24 දිනැති අංක CPC/CMC/3/1/1 දරන ලිපිය මගින් මහනුවර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් වාර්තාවක් කැඳවූ බවත්;

(ii) ඒ අනුව 2012.11.12 දින කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ස්ථානීය පරීක්ෂණයක් කර එහි ඉගෙනුම ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ පන්ති සංඛ්‍යාව අනුව, ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් නව දෙමහල් ගොඩනැගිල්ලක් ලබාදීම සුදුසු යැයි නිර්දේශ කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම විද්‍යාලය සඳහා නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

241/'15

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2000 සිට 2014 දක්වා ශ්‍රී ලංකාව සතු දළ නිල සංචිතයන්හි ආනයන ශක්‍යතාවය (මාසවලින්) වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ගණනය කරන ලද දළ නිල සංචිතයන්හි ආනයන ශක්‍යතාවය, වෙළඳ භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් ගැලපූ විට, එක් එක් වර්ෂය අනුව වෙනස් වන අකාරය කවරේද;

(iii) වර්ෂ 2000 සිට 2014 දක්වා මුළු විදේශීය වත්කම්වල ආනයන ශක්‍යතාවයෙහි අගය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2015 වර්ෂයේ මුල් මාස 9 තුළ දළ නිල සංචිතවල ආනයන ශක්‍යතාවය කෙසේවීද;

(v) එම තත්ත්වය කෙරෙහි බලපෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 12 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

205/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩවල කඩවීදිය, බංගලාගෙදර, අංක 21 දරන ස්ථානයේ පදිංචි ඒ. එම්. සහබ්දීන් මහතා, මහ/මදීනා ජාතික විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ කම්කරුවෙකු ලෙස 2006 වර්ෂයේ සිට සේවය කරන බවත්;

(ii) ඔහුගේ සේවය සහ සේවා කාලය සැලකිල්ලට ගෙන අනියම් හෝ තාවකාලික පදනම මත සේවයේ පිහිටුවීම සඳහා අදාළ ලිපි ලේඛන විටින් විට මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබුවත්, ඒ සඳහා කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

(iii) අවසන් වරට, 2014.11.18 දිනැති අයදුම්පත, විදුහල්පති/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සහබ්දීන් මහතාට අනියම් හෝ තාවකාලික පදනම මත කම්කරු පත්වීමක් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

229/’15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා බැංකුවේ අභ්‍යන්තර නිලධාරී පුහුණුවන්නන් බඳවා ගැනීම (2014) සඳහා වූ තරඟ විභාගයේ දී සිදු වූ අක්‍රමිකතා හා අසාධාරණයන් පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2014.06.08 දින කැළණිය විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලද එම තරඟ විභාගය සඳහා පෙනී සිටින ලද අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) විභාගයට පෙනී සිටින ලද අපේක්ෂකයින් අතරින් විභාගය සමත් වූ සහ අසමත් වූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) විභාගය සමත් වූ සියලුම දෙනාට පත්වීම් පිරිනමා තිබේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දූර/2002 චක්‍රලේඛ ප්‍රකාරව ලංකා බැංකුවේ සියලුම අභ්‍යන්තර උසස්වීම් සඳහා ක්‍රමවේදයක් තීරණය කර තිබියදී, සෑම විෂයකටම ලකුණු 40 වන ලකුණු සීමාව 50 දක්වා ඉහළ නැංවීමට හේතුව කවරේද;

(ii) මේ සම්බන්ධයෙන් විභාග අපේක්ෂකයින් කලින් දැනුවත් කර තිබේද;

(iii) පිළිගත් ක්‍රමවේදයක් මත මෙම විභාගය පවත්වා ඇති බවට එකඟ වන්නේද;

(iv) විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 5ක් ගතකර ඇති අතර ප්‍රතිඵල නැවත සමීක්ෂණය කිරීම සඳහා අවස්ථාවක් ලබා නොදීමට හේතු කවරේද;

(v) අගතියට පත් ලංකා බැංකු නිලධාරීන් වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 14 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

242/’15

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2000 සිට 2014 දක්වා,

(i) රජයේ විදේශ වත්කම්;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුවෙහි විදේශ වත්කම්;

(iii) තැන්පතු භාර ගන්නා ආයතනවල විදේශ වත්කම්;

(iv) සංචිතවලට අදාළ වගකීම්;

(v) ශුද්ධ ජාත්‍යන්තර සංචිතය;

සංයුක්ත වූ ආකාරය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලාංකිකයන්/රජය විසින් විදේශයන්හි සිදු කරන ලද සෘජු විදේශ ආයෝජන කවරේද;

(ii) එවැනි ආයෝජන රජය සතු විදේශ වත්කම් ලෙස ඉහත දැක්වූ සංඛ්‍යා දත්තවලට ඇතුළත් වන්නේද;

(iii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වර්ෂ 2000 සිට 2014 දක්වා විදේශ සංචිතයන්හි රත්‍රන් ශේෂය වෙනස් වී ඇති ආකාරය එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

245/'15

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩාංගණ 25ක් ඉදිකිරීම ආරම්භ කර ඇති බව එතුමා දන්නෙහිද;

(ආ) (i) එම ක්‍රීඩාංගණ අතරින් මේ වනවිට වැඩ ආරම්භ කර ඇති සහ විවෘත කර ඇති ක්‍රීඩාංගණ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙතෙක් වැඩ අවසන් කර නොමැති ක්‍රීඩාංගණවල වැඩ අවසන් කිරීමට අපේක්ෂා කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් , ඒ මන්ද?

251/'15

ගරු බිමල් රත්නායක මහතා,— කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011, 2012, 2013 සහ 2014 වර්ෂයන්හිදී සමීපතම ඥාතීන්ගේ අතවරයට ලක්වූ බවට පොලිසියට, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයට හා ජාතික ළමාරක්ෂක අධිකාරියට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 15 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

87/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රක්නා ආරක්ෂණ ලංකා ලිමිටඩ්, ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එය පිහිටවූ වර්ෂය සහ එකී වර්ෂයේ සිට 2015 දක්වා සමාගමේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සමාගම විසින් ආරක්ෂක සේවාව ලබා දුන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන කවරේද;

(ii) එකී ආයතන සමග ආරක්ෂාව සැපයීම සඳහා ගිවිසුම් ගත වූ වර්ෂය, දිනය හා ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2015 ජනවාරි සිට අද දක්වා කාලය තුළ මෙම සමාගම සේවා සැපයීමෙන් ඉවත් කොට ඇති රාජ්‍ය ආයතන තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

(iii) එලෙස ඉවත් කිරීමට හේතු කවරේද;

(iv) ඒ වෙනුවට උපයෝගී කරගෙන ඇති ආරක්ෂක සමාගම් කවරේද;

(v) එම ආදේශිත සමාගම්වල අධ්‍යක්ෂකවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම සමාගම විසින් ආරම්භයේ සිට වාර්ෂිකව උපයා ගෙන ඇති ආදායම සහ ලාභය කොපමණද;

(ii) මහා භාණ්ඩාගාරයට වාර්ෂිකව ලබාදී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

247/'15

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට මාසිකව රුපියල් ලක්ෂ 15කට වඩා වැඩි ආදායමක් ලබාදුන් "D" රථ ගාල, ටෙන්ඩර් ඉදිරිපත් කර නොමැති පුද්ගලයෙකුට 2015.01.30 දිනට ආසන්න දිනයකදී අඩු මුදලකට පෞද්ගලිකව බදු දුන් බවත්;

(ii) ඔහු විසින් මේ දක්වා කිසිදු මුදලක් එම අධිකාරියට ගෙවා නැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම අවිධිමත් ගනුදෙනුව ගැන සොයා බලා නැවත මෙම රථ ගාල පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) මෙම රථගාල ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව බදු දී ඇත්නම්, ඒ සඳහා වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් , ඒ මන්ද?

254/'15

ගරු බිමල් රත්නායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012, 2013 සහ 2014 වර්ෂයන්හිදී,

(i) ළමා අපචාර නඩු වැඩිම සංඛ්‍යාවක් ගොනුකර ඇති අධිකරණ 10, එක් එක් වර්ෂය අනුව අනුපිළිවෙළින් කවරේද;

(ii) එම අධිකරණයන්හි ළමා අපචාර නඩුවල චූදිතයින්, වැරදිකරුවන් බවට ඔප්පු වූ නඩු සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත එක් එක් අධිකරණයේ චූදිතයන් වැරදිකරුවන් වූ නඩු සංඛ්‍යාව, පැවරූ මුළු නඩු සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?